**ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය - 2015**

---

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1995 අංක 1 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතන නියමාවලියේ 19 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාරව විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1. 4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 07**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දේපල,පිරියත හා උපකරණවල සාධාරණ වටිනාකම් එහි ධාරණ අගයෙන් සැලකිය යුතු තරම් වන සහ ඉක්මන් වෙනස්වීම් වලින් යුක්ත වන්නේ නම් වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කිරීමක් අවශ්‍ය වුවත් 2015 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.72,126,250 ක් වූ විද්‍යායතනයේ ඉඩම් 2009 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දේපල,පිරියත හා උපකරණ පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට පත් වූ අවස්ථාවේ සිට ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් කාර්යාල උපකරණ, ලී බඩු, යන්ත්‍රෝපකරණ සහ ඉගැන්වීමේ උපකරණ සඳහා රු.159,607 කින් ක්ෂය අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ බව දක්වා තිබුණද පාඨමාලා 18 ක ආදායම් නිසි පරිදි හඳුනා ගැනීමකින් තොරව එම පාඨමාලා සඳහා දරන ලද වියදමට සමාන ප්‍රමාණයක් ආදායම් ලෙස ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1991 වර්ෂයට පෙර විද්‍යායතනය සතුවූ පර්චස් 233.2 ක ඉඩම් කට්ටි 03 ක වටිනාකම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.292,699 ක් වැඩියෙන් දැක්වීම හේතුවෙන් ස්ථාවර තැන්පතු වටිනාකම හා පොලී ආදායම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විද්‍යායතනය සතු නේවාසිකාගාර 05 ක සිසුන් 250 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එකතුව රු.75,300 ක්වූ හිඟ නේවාසිකාගාර කුලී අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2008 වර්ෂයේ සිට ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් රු.40,161 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් 09 කට අදාළව එකතුව රු.70,557 ක රඳවා ගැනීම් මුදල් නිරවුල් කිරීමට විගණන දිනය වූ 2016 ජුනි 03 වන දින විටත් කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂය සඳහා පුස්තකාල පොත් පිළිබඳ භෞතික සමීක්ෂණය සිදු කර නොතිබුණි. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයෙහි XX වන පරිච්ඡේදයේ 3(1) වගන්තිය සහ X පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | පැමිණීම හා පිටවීම සහ නිවාඩු සනාථ කර ගැනීම සඳහා අදාළ පොත්පත් ලේඛන විධිමත්ව පවත්වා නොතිබීම හේතුවෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබූ එකතුව රු.74,574,930 ක් වූ වැටුප් හා දීමනාවල නිවැරදිතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය |
| (ඇ) | 2000 ජුනි 14 දිනැති අංක 87(i) දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 03 ඡේදය | චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව අනුමත සීමාව ඉක්මවා පැය 1065 ක් සඳහා රු.127,760 ක අතිකාල දීමනා ගෙවා තිබුණි. |
| (ඈ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ පදනම් කරගෙන මාණ්ඩලික නිළධාරීන් වෙත වැටුප් මත පදනම් වූ සංග්‍රහ වියදම් දීමනා ලෙස රු.144,872 ක් ගෙවා තිබුණි. |
| (ඉ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව පරිගණක හා උපාංග සඳහා වූ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විද්‍යායතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.13,524,703 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ

ඌනතාවය රු.2,889,732 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.10,634,971 කින් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.32,346,152 කින් වර්ධනය වී තිබුණද පෞද්ගලික පඩිනඩි වියදම් රු.36,041,041 කින් හා ස්ථාවර වත්කම් ක්ෂය රු.7,781,097 කින් වැඩිවීම ඉහත ඌනතාවය වැඩිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූලා ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා මූලා ප්‍රතිඵලයේ අඛණ්ඩ ඌනතාවයක් පැවතුනද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී විද්‍යායතනයේ දායකත්වය අඛණ්ඩව ඉහළ යාමක් නිරීක්ෂණය විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දායකත්වය සියයට 20 කින් එනම් රු.33,187,167 කින් ඉහළ ගොස් තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තෝරා ගනු ලබන ශිෂ්‍යයන් ඇතුළත් කිරීම, ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ අධ්‍යයන අංශ වල ඉගැන්වීම සහ පුහුණු වීම සඳහා විධිවිධාන සැලැස්වීම, ශ්‍රී ලංකාවේ හෝ පිටරට විශ්වවිද්‍යාල සමඟ ඉගැන්වීම පුහුණු කිරීම හා පර්යේෂණ කටයුතු පිළිබඳ සබඳතා ඇති කර ගැනීම, උපාධි, ඩිප්ලෝමා, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය ප්‍රදාන ප්‍රදානය කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණු වන අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) <u>අධ්‍යයන කාර්යසාධනය</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2011/2012 අධ්‍යයන වර්ෂය හා සැසඳීමේදී 2012/2013 අධ්‍යයන වර්ෂය සඳහා බඳවා ගත් සිසුන් සංඛ්‍යාවේ සියයට 28 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

(ii) අවසන් විභාග ප්‍රතිඵල නිකුත් කළ 2011/2012 අධ්‍යයන වර්ෂයට වඩා 2012/2013 අධ්‍යයන වර්ෂයේ අවසන් විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව සිසුන් 32 ක වැඩි වීමක් පෙන්නුම් කළද, සමත් ප්‍රතිශතය සියයට 96 සිට 90 දක්වා අඩුවීමක් නිරීක්ෂණය විය.

(ආ) <u>පර්යේෂණ ආධාර ලබා දීම හා උපයෝජනය</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් හා සමාජ විද්‍යා හා උසස් අධ්‍යාපනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයෙන් (NCAS) ආචාර්ය උපාධිය හා දර්ශනපති උපාධි අධ්‍යයන කටයුතු සඳහා පර්යේෂණ ආධාර ලබා ගත් කථිකාචාර්යවරුන් දෙදෙනෙක් වසර 06 ක් හා කථිකාචාර්යවරුන් තිදෙනෙක් වසර 05 ක කාලයක් ගත කර ඇතත් 2016 ජුනි 30 දින වන විටත් පර්යේෂණ කටයුතු සම්පූර්ණ කර අවසාන වාර්තාව පර්යේෂණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය තුළ කථිකාචාර්යවරයෙකු වෙත පර්යේෂණ සඳහා ලබා දී තිබූ රු.250,000 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමකින් තොරව ආපසු විද්‍යායතනයට ගෙවා තිබුණි.

(ii) අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 38 දෙනෙකු සඳහා එකතුව රු.7,175,686 ක් පර්යේෂණ දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා

තිබුණද විද්‍යායතනයේ ප්‍රමාණවත් පරිදි නව පර්යේෂණ කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණු අතර 2015 වර්ෂය සඳහා පර්යේෂණ පරිසංවාදයන් පවත්වා නොතිබුණි.

**4.2 කළමණාකරණ ක්‍රියාකාරකම්**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) විද්‍යායතනයේ අධ්‍යක්ෂ තනතුර පූර්ණ කාලීන තනතුරක් වුවද ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටින මහාචාර්යවරයෙකු මෙම විද්‍යායතනයේ නිසි බලධාරී වශයෙන් 2015 මැයි 25 දින අධ්‍යක්ෂ තනතුරෙහි රාජකාරී ආවරණයට පත්කර තිබුණි. මාසිකව රු.180,000 ක ගරු දීමනාවක් විද්‍යායතනය විසින් ගෙවනු ලබන අතර වසරකට අධික කාලයක් ගත වුවද අධ්‍යක්ෂවරයෙකු පත් කිරීමට පියවර නොගෙන 2016 අගෝස්තු 26 තෙක් සේවය දීර්ඝ කර තිබුණි. ආයතනයේ ජ්‍යෙෂ්ඨ තනතුරක් කොන්ත්‍රාත් පදනම මත පැවතීම එහි ක්‍රියාකාරීත්වයට බලපෑමක් සිදුවිය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය හා 2016 මැයි 31 දක්වා වූ කාලය තුල සප්ත වාර්ෂික නිවාඩු ලබා සිටි විද්‍යායතනයේ ආචාර්යවරු 05 දෙනෙකු සඳහා එම කාලය වෙනුවෙන් එකතුව රු.1,979,494 ක් වූ අධ්‍යයන දීමනා හා එකතුව රු.446,182 ක් වූ පර්යේෂණ දීමනා ගෙවා තිබුණි.

**4.3 අරමුදල් ඌන උපයෝජනය**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උපාධි අපේක්ෂක සංවර්ධන වැඩ සටහන යටතේ ආයුර්වේද වෛද්‍ය උපාධි අපේක්ෂකයන්ගේ පංච කර්ම පුහුණුවීම් කටයුතු සඳහා සහ පරිගණක කටයුතු පිළිබඳ කුසලතා සංවර්ධනය කිරීම සඳහා 2010 ඔක්තෝබර් 18 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් රු. මිලියන 03 ක් වෙන් කර දී තිබුණි. 2016 ජුනි 03 දින වන විට වසර 05 කට අධික කාලයක් ගත වී තිබුණද පංච කර්ම පුහුණු කටයුතු කිසිවක් සිදු නොකිරීම නිසා රු.1,214,142 ක මුදලක් ඌන උපයෝජිතව තිබුණි.

(ආ) 2011 දෙසැම්බර් මාසයේදී උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රාජ්‍ය නිලධාරීන් අතර භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.475,000 ක මුදලක් වෙන්කර දී තිබුණද ප්‍රතිපාදිත මුදලින් සියයට 92 ක් වූ රු.436,200 ක් 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අදාල කාර්යය සඳහා උපයෝජනය නොකර ඌන උපයෝජිතව පැවතුණි.

**4.4 කොන්ත්‍රාත් පරිපාලනය**

------------------------

2015 දෙසැම්බර් 31 දින වන විට ආයතනයේ ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණු අතර 2016 මැයි 31 දිනට එම ව්‍යාපෘති 03 හි ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට ප්‍රධාන කොන්ත්‍රාත්තුවල වැඩ අවසන් කර නොතිබුණු අතර සාධාරණ පදනමකින් තොරව කාලය දීර්ඝ කරවා ප්‍රමාද දඩ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේදී විද්‍යායතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 09 ක් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි පුරප්පාඩු 10 ක්වූ අතර බාහිර කථිකාචාර්යවරුන් 21 දෙනෙකුගේ සේවය ලබා ගෙන තිබුණි.

(ආ) විද්‍යායතනයේ නව ඉදිකිරීම්, නඩත්තු කාර්යයන්වලදී ඇස්තමේන්තු සකස් කිරීම, ප්‍රමාණපත්‍ර සැකසීම, බිල්පත් නිර්දේශ කිරීම වැනි විවිධ කාර්යයන් සඳහා වසර ගණනාවක සිට තාවකාලික වැඩ ඉංජිනේරුවරුන්ගේ සේවය ලබා ගන්නා නමුත් අනුමත තනතුරක් වන වැඩ ඉංජිනේරු තනතුර වෙනුවෙන් නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.6 හඳුනා ගන්නා ලද පාඩු**

භාණ්ඩ තොග ඇණවුම් කිරීමේදී ආයතනයේ අවශ්‍යතාවය නොසලකා ඇණවුම් කිරීම හේතුවෙන් රු.91,202 ක් වටිනා තොග ඒකක 205 ක් දිගු කාලයක් ගබඩා තුළ පැවතීමෙන් භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත් වී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

සමාලෝචිත වර්ෂය තුළ ඉටුකරගත යුතුව තිබූ අරමුණු ක්‍රියාකාරකම් පිළිබඳ පැහැදිලි නිරූපනයක් සහිතව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම්, තථ්‍ය වියදම් සමඟ සැසඳීමේදී පිළිවෙලින් සියයට 10 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විද්‍යායතනයේ නිසි බලධාරීවරයාගේ අවධානයට යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | ඉඩම් තක්සේරු කර ගිණුම් ගත නොකිරීම හා දේපළ පිරියත සම්බන්ධයෙන් අවශ්‍යතාවය හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කර සාධාරණ වටිනාකම ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබීම. |
| (ආ) | කොන්ත්‍රාත් පාලනය | ගිවිසුම් ප්‍රකාර නියමිත දිනට ඉදිකිරීම් නිම නොකළ ව්‍යාපෘති සම්බන්ධව ප්‍රමාණවත් අවධානයක් යොමු නොවීම හා ප්‍රමාද දඩ අය කර ගැනීමට කටයුතු නොකිරීම. |